නිපුණතාව

# *රජය සමඟ සම්බන්ධතා පවත්වා ගනිමින් ව්‍යාපාර කරගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි.*

*ආර් පී හරිස්චන්ද්‍ර කුමාර,*

***B.sc(Ad)J,pura***

***PGDE Colombo***

*ශ්‍රී ධර්මානන්ද විද්‍යායතන පිරුවන,*

*මිරිස්වත්ත*

*බලංගොඩ*

# නිපුණතා මට්ටම්

| | බර තැබීම |
|---|---|
| 01) රජය ව්‍යාපාර වලට මැදිහත් වන ආකාරය විමර්ශණය කරයි. | 04/30 |
| 02) රජයක ආර්ථික අරමුණු ඉටුකර ගැනීම සඳහා ව්‍යාපාර දායක වන ආකාරය පෙන්වා දෙයි. | 04/30 |
| 03) රජයේ ෆිස්කල් ප්‍රතිපත්තිවලට අනුකූලව ව්‍යාපාර පවත්වාගෙන යාමේ වැදගත්කම අගයයි. | 06/30 |
| 04 රජයේ මූල්‍ය ප්‍රතිපත්තිවලට අනුකූල ව ව්‍යාපාර පවත්වාගෙන යාමේ වැදගත්කම අගයයි. | 06/30 |
| 05 පාරිභෝගික ආරක්ෂණය සඳහා රජය ගන්නා ක්‍රියාමාර්ගවලට අනුගත වෙමින් ව්‍යාපාර පවත්වාගෙන යාමේ අවශ්‍යතාව පෙන්වා දෙයි. | 05/30 |
| 06 පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනවල කාර්යභාරය විමසා බලයි. | 05/30 |

# රජය හා ව්‍යාපාර අතර අන්තර් ක්‍රියාකාරීත්වය.

# Interaction Between Government & Bñiness

ඕනෑම රටක ආර්ථිකය මෙහෙයවනු ලබන ප්‍රධාන කාරකය වනුයේ එරට රජයයි. ඒ අනුව ව්‍යාපාරයක් ආරම්භයේ සිට අවසානය දක්වා විවිධ උපකාරක සේවා හා වෙනත් පහසුකම් අවශ්‍ය වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ එම සේවා සපයන රාජ්‍ය පරිපාලන ව්‍යුහ මට්ටම් තුනකි.

1. මධ්‍යම රජය

2. පළාත් සභා

3. පළාත් පාලන ආයතන
   - මහ නගර සභා
   - නගර සභා
   - ප්‍රාදේශීය සභා

එමෙන්ම ශ්‍රී ලංකාව තුල ව්‍යාපාර කෙරෙහි රාජ්‍ය බලපෑම් තුන් ආකාරයකින් සිදුවේ.

01 මධ්‍යම රජයේ ප්‍රතිපත්ති, නිතිරීති, රෙගුලාසි

02 පලාත් සභාවේ ප්‍රතිපත්ති, නිතිරීති, රෙගුලාසි

03 පලාත් පාලන ආයතන වල ප්‍රතිපත්ති, නිතිරීති, රෙගුලාසි

- **ශ්‍රී ලංකාවේ මිශ්‍ර ආර්ථිකයක් පවතින බැවින් රජයේ සහ පෞද්ගලික අංශයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අන්නෝන්‍ය වශයෙන් බැඳී පවතී.**

## රජය ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරන ආකාරය

- යටිතල පහසුකම් සපයන්නකු ලෙස
  උදාහරණ :- ප්‍රවාහනය
  සන්නිවේදනය
  විදුලිය
- නියාමකයකු ලෙස /නීතිරීති පැනවීමෙන්
  උදාහරණ :- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත

  විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තුව යනාදිය ඇති කිරීම
- ගනුදෙනු කරුවකු ලෙස / ඍජු සහයෝගීතාවයෙන්
  උදාහරණ :- වී
  මුං ඇට යනාදිය මිලදී ගැනීම
- තරග කරකරුවකු ලෙස
  උදාහරණ :- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යනාදී ආයතන හරහා තරග කිරීම

- ප්‍රතිපත්ති සම්පාදකයකු ලෙස
  උදාහරණ :- මූල්‍ය ප්‍රතිපත්තිය
  පිස්කල් ප්‍රතිපත්තිය
- දිරිගැන්වීම් සපයන්නකු ලෙස
  උදාහරණ :- බදු සහන
  මූල්‍ය පහසුකම්
  අලෙවි පහසුකම්
- බදු අය කරන්නකු ලෙස
  උදාහරණ :- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
  සුරාබදු දෙපාර්තමේන්තුව  යනාදිය හරහා බලපෑම් කිරීම.

## <u>රජය ව්‍යාපාර කෙරෙහි බලපෑම් කිරීමට හේතු</u>

01 රටේ ආර්ථික කටයුතු කළමනාකරණය කිරීම සඳහා

02 සුබසාධන භාණ්ඩ සැපයීමට

කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් පරිභෝජනයෙන් ධන බාහිරතා ඇති කරන්නේ නම් එය සුබසාධන භාණ්ඩයකි.

උදාහරණ :- රෝහල්

පාසල්

මහජන පුස්තකාල

03 පොදු භාණ්ඩ සැපයීම සඳහා

ගෙවීම්ක් කරනු ලැබුවත් නැතත් සාමූහිකව පරිභෝජනය කළ හැකි පාරිභෝජනයේ තරගකාරීත්වයක් පොදු භාණ්ඩ වේ.

උදාහරණ :- ප්‍රදීපාගාර

හෝරා ස්ථම්භක  / ඔරලෝසු කණු

වීදි ආලෝකය

04 පෞද්ගලික අංශයේ ඒකාධිකාරිත්වය පාලනය කිරීමට.

05 යටිතල පහසුකම් සැපයීම සඳහා

06 ව්‍යාපෘති සඳහා අවශ්‍ය විවිධ ආධාර සැපයීමට.

07 සමාජ හා පරිසර ලැදියාව ආරක්ෂා කිරීම් සඳහා

08 වෙළඳ විෂමාචාර වලින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා

# රජයේ ආර්ථික අරමුණු.

01 පූර්ණ සේවා නියුක්තිය.
ආර්ථිකයක් සතු සියලු නිෂ්පාදන සම්පත් ඵලදායී ලෙස නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමයි.

02 ආර්ථික වර්ධනය. / ආර්ථික වෘද්ධිය.
රටක දිගුකාලීනව නිෂ්පාදන ධාරිතාවේ අඛණ්ඩ වර්ධනයක් පවත්වාගෙන යාමයි.

03 ආර්ථික සංවර්ධනය.
සියලුම මිනිස් ජීවිතවල ගුණාත්මක තත්ත්වය වර්ධනය කිරීමයි.

04 තිරසර සංවර්ධනය. / පරිසර ගුණාත්මක බව.
පරිසර සම්පත් ආරක්ෂා කරගනිමින් ගුණාත්මක බව වර්ධනය කිරීමයි.

05 අභ්‍යන්තර ස්ථායීතාව. / මිල ස්ථායීතාව. / ආර්ථික ස්ථායිතාව.
රටක මිල මට්ටම් නොවෙනස්ව තබා ගැනීමයි. එනම් සමස්ත මිල මට්ටම් උච්චාවචනයන් පාලනය කිරීමයි.

06 බාහිර ස්ථායිතාව. / ගෙවුම් ශේෂය ශක්තිමත් කරගැනීම.
රටක විදේශ වෙළෙඳ කටයුතු සතුටුදායක මට්ටමක පවත්වාගෙන යාමයි.

07 ආර්ථික කාර්යක්ෂමතාවය.
නිෂ්පාදන ක්‍රියාවලියේ සහ සම්පත් බෙදියාමේ කාර්යක්ෂමතාවය ඇතිකර ගත යුතුය යන්නයි.

08 ආර්ථික නිදහස.
පාරිභෝගික ව්‍යාපාරික හා ශ්‍රමික යන පාර්ශ්වයන්ට සිය ආර්ථික ක්‍රියාකාරකම් වල නියුක්ත වීමට අවශ්‍ය නිදහස හා පසුබිම සකසා දීමයි.

09 ආර්ථික සුරක්ෂිතතාවය.
වියපත්, ආබාධිත හා විරැකියා යන පාර්ශවයන්ට ආර්ථික වශයෙන් සංරක්ෂිත තාවයක් ඇති කිරීමයි.

10 ආදායම් විෂමතා අඩු කිරීම.
රටේ සමස්ත ආදායම හා නිෂ්පාදිතය එහි වෙසෙන පුද්ගලයින් අතර සාධාරණ පදනමක් මත බෙදා හැරීමයි.

## රජයේ ආර්ථික අරමුණු ඉටුකර ගැනිමට ව්‍යාපාරික ප්‍රජාව දායක වන ආකාරය සහ එමඟින් ඉටුවන ආර්ථික අරමුණු.

| දායක වන ආකාරය. | ඉටුවන ආර්ථික අරමුණු. |
|---|---|
| 01 නිසි නිසි පරිදි බදු ගෙවීම. | ආදායම් විෂමතාවය අවම විම.<br>ආර්ථික වර්ධනය. |
| 02 රැකියා අවස්ථා සැපයීම. | පූර්ණ සේවා නියුක්තිය. |
| 03 විදේශ විනිමය ඉපයීම. | බාහිර ස්ථායිතාව. |
| 04 පරිසරය සුරැකීම. | තිරසර සංවර්ධනය. |
| 05 දේශීය සම්පත් භාවිතා කිරීම. | පූර්ණ සේවා නියුක්තිය. |
| 06 සමාජ සුභසාධනයට දායකවීම. | තිරසාර සංවර්ධනය. |

## රජය හා ව්‍යාපාර අතර අන්තර් සම්බන්ධතාවය.

රජයේ ආරමුණු වන පූර්ණ සේවා නියුක්තිය, ආර්ථික වර්ධනය, තිරසාර සංවර්ධනය, යනාදී අරමුණු ඉටුකර ගැනීමෙහි ව්‍යාපාර ආයතනවල දායකත්වය රජය අපේක්ෂා කරන අතර බදු, යටිතල පහසුකම්, මූල්‍ය, තාක්ෂණික, අලෙවි, යනාදී විවිධ පහසුකම් සපයා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට යෝග්‍ය පරිසරයක් ඇති කිරීම රජයෙන් ව්‍යාපාර අපේක්ෂා කරයි.

එහිදී රජයේ සහ සමාජයේ අපේක්ෂා ඉටු වන පරිදි ව්‍යාපාර පවත්වාගෙන යාම ව්‍යාපාරවල වගකීමක් වේ. නිසි නිසි පරිදි බදු ගෙවීම, දේශීය සම්පත් භාවිතය, පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම යනාදිය රජය ව්‍යාපාර වලින් අපේක්ෂා කරන වගකීම් වේ. මේවා රජය ව්‍යාපාර වලට අවශ්‍ය පහසුකම් සැපයීම තුලින් ව්‍යාපාර දිරි ගැන්වීමට කටයුතු කරන අතර ව්‍යාපාර සංවර්ධනය තුළින් රජයේ අරමුණු ඉටුකර ගත හැකි නිසා රජය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් පවතී.

## ආර්ථික ප්‍රතිපත්ති

රජයේ ආර්ථික අරමුණු අරමුණු මුදුන් පමුණුවා ගැනීම පිණිස රජය විසින් ක්‍රියාවට නංවන උපකරණ ආර්ථික ප්‍රතිපත්ති වෙයි. රජයේ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්ති 02කි.

01 ෆිස්කල් ප්‍රතිපත්තිය / අයවැය ප්‍රතිපත්තිය / බදු ප්‍රතිපත්තිය / රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය.
02 මූල්‍ය ප්‍රතිපත්තිය.
මීට අමතරව පහත ප්‍රතිපත්තිද ද හඳුනා ගත හැක.
03 විදේශ වෙළඳ ප්‍රතිපත්තිය.
04 ඍජු පාලන ප්‍රතිපත්තිය.
05 සැප අංශ ආර්ථික ප්‍රතිපත්තිය.
06 ආදායම් ප්‍රතිපත්තිය.

## ෆිස්කල් ප්‍රතිපත්තිය

සාර්ව ආර්ථික ස්ථායිතාවය ආරක්ෂා කර ගැනීමේ අරමුණින් රාජ්‍ය ආදායම සහ රාජ්‍ය වියදම පිළිබඳව ගන්නාවූ තිරණ ෆිස්කල් ප්‍රතිපත්තියයි.

මෙහිදී රජය විසින් ආර්ථිකයට බලපාන පරිදි බදු කරණය, රාජ්‍ය වියදම, රාජ්‍ය ණය යනාදිය හැසිරවීම සිදු කරයි.

- මෙම ප්‍රතිපත්තිය සකස් කිරීමේ මූලික වගකීම මුදල් අමාත්‍යාංශය නැතහොත් මහා භාණ්ඩාගාරය විසින් දරන අතර ඒ සඳහා අනුමැතිය පාර්ලිමේන්තුවෙන් ලබාගත යුතුය.
- සාර්ව ආර්ථික ස්ථායිතාවය ආරක්ෂා කිරීම මෙහි ප්‍රධාන අරමුණයි.

## ෆිස්කල් ප්‍රතිපත්තිය ක්‍රියාවටට නැංවීම් සඳහා භාවිතා කරන උපකරණ.

01 බදු හා ගාස්තු (රාජ්‍ය ආදායම)

- නව බදු පැනවීම.
- පැවති බදු අහෝසි කිරීම.
- බදු විරාම ලබාදීම.
- බදු අනුපාත සංශෝධනය කිරිම.

02 රාජ්‍ය වියදම

- රාජ්‍ය වියදම් අඩු වැඩි කිරීම. එනම් වර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් පාලනය කිරීමයි.

03 රාජ්‍ය ණය.

- රාජ්‍ය ණය ලබා ගැනීම හා පියවීම.

## රාජ්‍ය ආදායම

යම් ආර්ථිකයක මුදල් වර්ෂයක් තුළ සියලු මාර්ග වලින් ලැබෙන අයභාරය රාජ්‍ය ආදායමයි. මෙය ප්‍රධාන කොටස් 02කි.

01 බදු ආදායම

02 බදු නොවන ආදායම

## බද්ධ (tax)

කිසියම් පුද්ගලයෙක් හෝ ආයතනයක් විසින් අනිවාර්යෙන් ගෙවිය යුතු යැයි රජය හෝ රජයේ බලධාරී ආයතනයක් විසින් නියම කරනු ලබන ගෙවීමකි. එනම්, සමස්ත සමාජයට අත්වන ප්‍රතිලාභ ගැන සලකා රජය සතු අධිකරණමය බලය භාවිතා කොට අයකරනු ලබන ගෙවන්නට සෘජු ප්‍රතිලාභයක් අත් නොවන පැහැර හැරිය නොහැකි අනිවාර්ය ගෙවීකි.

රාජ්‍ය පරිපාල ක්‍රියාදාමය හැරුණු කොට රැස් කර ගනු ලබන බදු මගින් වර්තමාන සමාජයේ සුවිශේෂී කාර්යභාර්‍යයන් දෙකක් රජයෙන් අපේක්ෂා කරයි.

01) අයකරනු ලබන බදු මගින් රටේ ආර්ථික කාර්යක්ෂමතාවය පුළුල් කිරීම.

02) සමාජයේ ආදායම් සාධාරණ ලෙස බෙදී යාම.

## බදු වර්ගීකරණය කිරීම

බදු බර විතැන් කිරීමේ හැකියාව අනුව (බදු අනුපාතය විතැන් කිරීමේ හැකියාව අනුව) බදු ප්‍රධාන කොටස් දෙකකි.

### 01) සෘජු බදු

කිසියම් පුද්ගලයකුගේ ආදායම හා ධනය මත පුද්ගලයා හෝ ආයතනය විසින්ම ගෙවන බදුය. මෙම බදු විතැන් කළ නොහැක. නැතහොත් නෛතික වශයෙන් බද්ධට යටත් වන පුද්ගලයාට හෝ ආයතනය විසින් ගෙවිය යුතු වන එය වෙනත් කෙනෙකුට විතැන් කළ නොහැකි බද්ධකි.

උදාහරණ:- පෞද්ගලික ආදායම් බදු

සමාගම් ලාභ බදු

උපයන විට ගෙවීම් බදු

මුද්දර ගාස්තු

### 02) වක්‍ර බදු

භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, පරිභෝජනය සහ වියදම මත අයකරන බදුයි. මෙම බදු බර විටතැන් කළ හැක. නැතහොත් නෛතික වශයෙන් බද්දට යටත් වන පුද්ගලයාට එම බද්ධ වෙනත් කෙනෙකුට පැවරිය හැකි නම් එය වක්‍ර බද්ධකි.

උදාහරණ:- එකතු කල අගය මත බදු

ආනයන බදු

දේශීය භාණ්ඩ බදු

ආර්ථික සේවා ගාස්තු

ජාතික ගොඩනැගීමේ ගාස්තු

## බදු පදනම මත

### 01) අනුක්‍රමික බදු

ආදායම වැඩි වන විට අය කරන බදු ප්‍රතිශතය වැඩි වේ නම් එය අනුක්‍රමික බද්ධකි.

උදාහරණ:- ආදායම් බදු

සමාගම් ලාභ බදු

### 02) ප්‍රතික්‍රමික බදු

ආදායම වැඩි වන විට ක්‍රමයෙන් බදු අනුපාතය අඩු වන බද්ධකි.

උදාහරණ:- දේශිය භාණ්ඩ බදු

නිෂ්පාදන බදු (පෙට්‍රල්, මත්පැන්, භූමිතෙල්, සිකරට්)

### 03) සමානුපාතික බදු

ඕනෑම ආදායම් මට්ටමකදී එනම් බදු පදනමේ ඕනෑම මට්ටමකදී ස්ථාවරව බදු අනුපාතිකයක් අයකරන බද්ධකී.

උදාහරණ:- එකතු කළ අගය මත බදු

ආර්ථික සේවා ගාස්තු

ආනයන බදු

**ඉහත වර්ගීකරණ දෙක අතරින් ප්‍රධාන වර්ගීකරනය වනුයේ බදු බර විතැන් කිරීමේ හැකියාව අනුව බදු වර්ගීකරණයි (විශය නිර්දේශයට අනුව)**

## රජයේ බදු නොවන ආදායම් මූලාශ්‍ර

01) රාජ්‍ය ව්‍යවසායයන්ගේ ලාභ හා ලභාංශ

02) ජාතික ලොතරැයි අරමුදල්

03) බදු කුලී

04) පොලී

05) සේවා හා පරිපාලන ගාස්තු

06) ප්‍රාග්ධන භාණ්ඩ විකුණුම්

07) ගාස්තු හා අයකිරීම්

## රාජ්‍ය ආදායම් සංයුතිය

2019 මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව රාජ්‍ය ආදායම බදු ආදායමෙන් ලැබී ඇති දායකත්වය සියයට 91%කි එය පහත ලෙස ලැබී ඇත.

එකතු කළ අගය මත බදු

නිෂ්පාදන බදු

ආදායම් බදු

ආනයන බදු

අනෙකුත් බදු


බදු නොවන ආදායමෙන් 9%ක දායකත්වයක් රාජ්‍ය ආදායමට ලැබී ඇත.

ලාභ හා ලාභාංශ

ගාස්තු අයකිරීම්

පොලී ආදායම්

වෙනත් ආදායම්




රජයේ බදු ආදායම තුල වක්‍ර බදු වල දායකත්වය සාපේක්ෂව ඉහළ අගයක් ගනී. ඊට බලපාන ප්‍රධාන සාධක කිහිපයකී.

01) භාණ්ඩ හා සේවා මත බදු අයකිරීම.

02) වක්‍ර බදු ගෙවීම් පැහැර හැරීමට අපහසු වීම.

03) අයකර ගැනීමට පහසු වීම.

04) අයකර ගත හැකි බදු ආදායම කල්තියා තීරණය කර ගත හැකි වීම.

## රජය විසින් බදු දිරිගැන්වීම් ලබාදීමේ අරමුණු

01) දේශීය ආයෝජන දිරිගැන්විම.

02) විදේශ ආයෝජන රට තුළට ගෙන්වා ගැනීම.

03) රැකියා අවස්ථා උදාකර ගැනිම.

## රාජ්‍ය ආදායම් රැස් කිරීම සම්බන්ධව ක්‍රියා කරන ප්‍රධාන ආයතන සහ එමගින් රැස් කරන බදු වර්ග

| ආයතන | බදු වර්ග |
|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | ආදායම් බදු<br>සමාගම් බදු<br>සමාගම් ලාභාංශ බදු<br>උපයන විට ගෙවීම් බදු<br>රඳවා ගැනීමේ බදු<br>ඔට්ටු හා සූදුබදු<br>මුද්දර ගාස්තු<br>ආර්ථික සේවා ගාස්තු<br>ජාතිය ගොඩනැගීමේ බද්ධ |
| රේගු දෙපාර්තමේන්තුව | තීරුබදු<br>වරාය හා ගුවන් තොටුපල<br>තීරු බදු අධි බාරය<br>සංවර්ධන බදු |
| සුරාබදු දෙපාර්තමේන්තුව | දුම් කොළ හා මධ්‍යසාර බදු |
| මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව | මෝටර් රථ ලියාපදිංචි කිරීමේ බදු<br>මෝටර් රථ පැවරුම් බදු<br>මාදිලි වෙනස් කිරීම් බදු |
| පළාත් පාලන ආයතන | වරිපනම් බදු<br>විනෝද බද්ධ<br>පිරිවැටුම් බදු<br>ව්‍යාපාරික ස්ථාන බදු |
| පළාත් සභා | ආදායම් බලපත්‍ර ගාස්තු |

## රජය විසින් එකතු කල අගය මත බද්ද හඳුන්වාදීමට හේතු

භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා බෙදාහැරිම යන සෑම අදියරක දී ආර්ථිකයට අලුතින් එකතු කරන වටිනාකම මත අයකරන බද්දකි.

භාණ්ඩ හා සේවා බද්ධ(GST) හා ජාතික ආරක්ෂක බද්ධ(NST) ඒකාබද්ධ කොට මෙම බද්ධ හඳුන්වා දෙන ලදී.

01) රජයේ බදු අය කිරිමේ ක්‍රමය පිළිබඳව ජනතාව තුළ පැවති අධික විරෝධය.

02) බදු මත බදු අය කිරීම නිසා බදු ක්‍රමය අකාර්යක්ෂම වීම.

03) බදු ක්‍රමය සඳහා වැඩි පිරිසක් ආකර්ෂණය කර ගැනීම.

04) රාජ්‍ය බදු ආදායම තුළ ඉහළ අගයක් පැවතීම.

## රාජ්‍ය වියදම

කිසියම් කාලපරිච්ඡේදයක් තුල හෝ වර්ෂයක් තුළ රටේ ප්‍රජාව වෙනුවෙන් රජයවියදම් කරන සියලු මුදල් ප්‍රමානය නැතහොත් රජයක් එදිනෙදා කටයුතු පවත්වාගෙන යාමේ හා ආර්ථික වර්ධනය සඳහා වර්ශයක් තුලදි දරන්නා වු මුලු වියදමයි.

එනම් රටක ආර්ථික ක්‍රියාකාරකම් වෙනුවෙන් මධ්‍යම ආණ්ඩුව, පළාත් සභා, පාළාත් පාලන ආයතන විසින් දරණ වියදමයි.

රාජ්‍ය වියදම ප්‍රධාන කොටස් 02කට බෙදිය හැක.

01) වර්තන වියදම් / පුනරාවර්තන වියදම්

රාජ්‍ය සේවා කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා දරන වියදම්ය. ආර්ථික වර්ගීකරණයයට අනුව ශ්‍රී ලංකාවේ මධ්‍යම රජයේ වර්තන වියදම් ප්‍රධාන සංරචක තුනකි.

01 භාණ්ඩ හා සේවා සඳහා වන වර්තන වියදම් (වැටුප් හා වේතන)
02 පොළී ගෙවීම්
03 වර්ථන පැවරුම් හා සහනාධාර

- විශ්‍රාම වැටුප්
- සමුද්ධි දිමනා
- පොහොර සහණාධාර

02) ප්‍රාග්ධන වියදම් / රාජ්‍ය ආයෝජන වියදම්

වසරකට වඩා වැඩි කල්පැවැත්මක් සහිත මුර්ත වත්කම් හා ඒවා අත්පත් කර ගැනීම පුනුරුත්ථාපනය වැඩිදියුණු කිරිම සඳහා දරන වියදම් ය.

උදාහරණ:-මුර්ත වත්කම් හා ඒවා අත්පත් කර ගැනීම

(මහා මාර්ග හා පාලම්)

ප්‍රාග්ධන පැවරුම්

## රජය විසින් ව්‍යාපාර කෙරෙහි බලපෑම් කිරීමට පනවා ඇති විවිධ නීති රීති

01) පාරිභෝගික නීති

උදාහරණ:- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත

02) සේවක නීති

උදාහරණ:-සේවක සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ පනත

03) තරගකාරිත්වයට අදාළ නීති

උදාහරණ:- ඒකාධිකාරී හා ඒකාබද්ධ වීම් පාලනය කිරීමේ පනත

## ව්‍යාපාර කෙරෙහි ශ්‍රී ලංකා රජය විසින් ලබාදෙන අනුග්‍රහයන්

01) උපදෙස් ලබා දීම

02) තොරතුරු සැපයීම

03) කුඩා ව්‍යාපාර සඳහා විවිධ දිරිදීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

උදාහරණ:- ණය යෝජනා ක්‍රම

බදු නිදහස් කිරීම

## fiස්කල් ප්‍රතිපත්තිය ව්‍යාපාර වලට බලපාන ආකාරය

01) රජය ව්‍යාපාර වලින් අය කරන බදු යටිතල පහසුකම් වර්ධනයට යෙදවීම නිසා ව්‍යාපාර වර්ධනය වීම.

02) ආනයනය මත පනවන බදු නිසා දේශිය කර්මාන්ත ආරක්ෂා වීම.

03) නිෂ්පාදනය මත පනවන විවිධ වර්ගයේ බදු නිසා භාණ්ඩ මිල ඉහල යාම.

## මූල්‍ය ප්‍රතිපත්තිය

මහ බැංකුවේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා ආර්ථිකයේ මුදල් සැපයුම හා පොළී අනුපාතිකය කෙරෙහි බලපෑම් කිරීමට අනුගමනය කරන ක්‍රියාමාර්ගයි. එනම් ආර්ථිකයේ මුදල් සැපයුම හා උද්ධමනය කෙරෙහි බලපෑම් ඇති කිරීම සඳහා රජය අනුගමනය කරන කටයුතුය.

- ❖ රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකු විසින් මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවයි.
- ❖ දේශීය ආර්ථිකයේ මිල ස්ථායිතාවය පවත්වාගෙන යාම මෙහි අරමුණයි.

## මුල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැන්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාවිතා කරන උපකරණ

01) විචල්‍ය සංචිත අනුපාතිකය / ව්‍යස්ථාපිත සංචිත අනුපාතිකය/සංචිත අවශ්‍යතා නියම කිරීම.

02) විවට / විවෘත වෙළෙදපළ කටයුතු

03) නිත්‍ය පහසුකම් අනුපාතිකය (මෙය මීට පෙර ප්‍රතිපත්තිමය පොලී අනුපාතය ලෙස හැඳින්විය.

04) යහ පෙළඹවීම්

05) ණය සීමා පැනවීම

06) වට්ටම් අනුපාතය වෙනස් කිරීම

## විචල්‍ය සංචිත අනුපාතය

වාණිජ බැංකුවල පවත්නා තැන්පතු වලට අනුව මහ බැංකුවේ පවත්වාගෙන යා යුතු තැන්පතු ප්‍රමාණය දැක්වෙන අනුපාතිකයයි.

- ❖ මහ බැංකුව විසින් විචල්‍ය සංචිත අනුපාතිකය පහළ දැමූ විට වාණිජ බැංකු විසින් මහ බැංකුවේ තැන්පත් කළ යුතු මුදල් ප්‍රමාණය අඩු වන නිසා සැපයිය හැකි ණය ප්‍රමාණය වැඩි වීමෙන් රටේ මුදල් සැපයුම වැඩි වේ.
- ❖ මහ බැංකුව විචල්‍ය සංචිත අනුපාතිකය ඉහළ දමන විට වාණිජ බැංකු විසින් මහ බැංකුවේ තැන්පත් කළ යුතු මුදල් ප්‍රමාණය වැඩි වන නිසා සැපයිය හැකි ණය ප්‍රමාණය අඩු වීමෙන් රටේ මුදල් සැපයුම අඩු වේ.

## විවට / විවෘත වෙළෙදපළ කටයුතු

මුදල් වෙළඳපලේ ද්‍රවශීලතාවය හා පොලී අනුපාතය කෙරෙහි බලපෑම් කිරීම සඳහා මහ බැංකුව විසින් රජයේ සුරකුම්පත් හෝ රජය විසින් සහතික කළ සුරකුම්පත් විකිණීම හෝ මිලදී ගැනීම විවට වෙළෙදපොළ කටයුතු ලෙස හඳුන්වයි.

- ❖ රජය විසින් සුරැකුම්පත් විකිණීමේදි වාණිජ බැංකු ඇතුළු අදාළ පාර්ශව එවා මිලදී ගන්නා බැවින් රටේ මුදල් සැපයුම අඩුවීම හෙවත් සංකෝචනය වීම සිදුවේ.

- ❖ රජය විසින් සුරැකුම්පත් මිලදි ගන්නා විට වාණිජ බැංකු ඇතුළු අදාළ පාර්ශවයන්ට මුදල් ගලා ඒමක් සිදුවන බැවින් රටේ සමස්ත මුදල් සැපයුම වැඩිවීම හෙවත් රටේ සමස්ත මුදල් සැපයුම ඉහලයාමක් සිදුවේ.

## <u>නිත්‍ය පහසුකම් අනුපාතික</u>

රටේ සමස්ත මුදල් සැපයුම නැතහොත් මුල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා භාවිතා කරන පොලී අනුපාතිකයි. ප්‍රධාන නිත්‍ය පහසුකම් අනුපාත 03කී.

**01) බැංකු පොලී අනුපාතිකය**

වාණිජ බැංකු මූල්‍ය දුෂ්කරතාවයට පත් වූ අවස්ථා වල මහ බැංකුව අවසාන ණය දෙන්නා වශයෙන් ලබාදෙන ණය වලදී අය කරනු ලබන පොළි අනුපාතිකයයි.

**ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙය පහත පරිදි නිර්වචනය කොට ඇත.**

"වාණිජ බැංකුවල තාවකාලික ද්‍රවශීලතා අරමුණු ඉටු කර ගැනිම වස් ශ්‍රී ලංකා මහ බැංකුවේ අත්තිකාරම් ප්‍රදානය කිරීමේ දී ඒ සඳහා පැණවෙන පොලි අනුපාතිකයයි."

- ❖ මහ බැංකුව බැංකු පොලී අනුපාතය ඉහළ දැමූ විට රටේ සමස්ථ මුදල් සැපයුම අඩු වේ.
- ❖ මහ බැංකුව බැංකු පොලී අනුපාතය පහළ දැමූ විට රටේ සමස්ථ මුදල් සැපයුම වැඩි වේ.

**02) නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR)**

ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු වලදි එනම් නිත්‍ය පහසුකම් යටතේ මහ බැංකුව හා වාණිජ බැංකු අතර කෙරෙන ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුවලදී අදාළ වන දෛනික පොලී අනුපාතිකයයි. මීට පෙර මෙය **ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය** ලෙස හැඳින්විය.

**03) නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR)**

නිත්‍ය පහසුකම් යටතේ මහ බැංකුව හා වාණිජ බැංකු අතර කෙරෙන ප්‍රතිවිකුණුම් ගනුදෙනුවලදී අදාළ වන දෛනික පොලී අනුපාතිකයයි. මෙය අතීතයේ **ප්‍රති විකුණුම් පොලී අනුපාතය** ලෙස හැඳින්විය.

## <u>මූල්‍ය උපකරණ ක්‍රියාවට නන්වන විට රටේ මුදල් සැපයුමට සිදුවන බලපෑම.</u>

| **උපකරණය** | **මුදල් සැපයුම ප්‍රසාරණය / මුදල් සැපයුම වැඩි කිරිම** | **මුදල් සැපයුම සංකොචනය / මුදල් සැපයුම අඩු කිරිම** |
|---|---|---|
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය | සංචිත අවශ්‍යතා පහළ දැමීම | සංචිත අවශ්‍යතා ඉහළ දැමීම |
| විවට වෙළෙඳපොළ කටයුතු | සුරකුම්පත් මිලදී ගැනීම | සුරකුම්පත් විකිණීම |
| බැංකු පොලී අනුපාතය | බැංකු පොලී අනුපාතය පහළ හෙලීම | බැංකු පොලී අනුපාතය ඉහළ දැමීම් |
| බැංකු ණය පාලනය | ලිහිල් කිරීම් හෝ අඩු කිරීම | දැඩි කිරීම හෙවත් වැඩි කිරිම |

## ණය සීමා පැනවීම

ආර්ථිකයේ දිරිමත්කළ යුතු හා අධෛර්යමත් කළ යුතු අංශ වෙනුවෙන් ණය ගලායාම සීමා කිරීමියි. මෙය ප්‍රධාන ආකාර දෙකකට සිදු වේ.

01) ප්‍රමාණාත්මක ණය සීමා පැන්වීම.

රටේ සමස්ථ මුදල් සැපයුමට බලපෑමක් කළ හැකි බැංකු ණය ප්‍රමාණය අඩු වැඩි කිරීම තුළින් මුදල් සැපයුම පාලනය කිරීමයි.

02) ගුණාත්මක ණය පාලනය

ආර්ථිකයේ ණය ගලා යන දිසාව පාලනය කිරීම නැතහොත් යම් යම් අංශ සඳහා ණය ගලායාම දිරිමත් කිරීම හෝ අධෛර්යමත් කෙරෙන ණය පාලනයයි.

මීට අමතරව මුල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා පහත ක්‍රමද භාවිතා කරයි.

03) යහ පෙළඹවීම

04) ප්‍රති මූල්‍ය පහසුකම්

05) වර්ණාත්මක පොලි අනුපාතිකය

06) ණය සඳහා පරිණත කාල නියම කිරීම

07) ණයවර ලිපි කාසි ආන්තික නියම කිරිම

## මූල්‍ය ප්‍රතිපත්තිය ව්‍යාපාර වලට බලපාන ආකාරය

01) බැංකු පොලි අනුපාතය පහළ හෙළීම තුළින් ව්‍යාපාරිකයන්ට අවම පොලියක් යටතේ ණය ලබා ගැනීමට හැකිවීම නිසා ව්‍යාපාර කටයුතු පුළුල් වේ.

02) සංචිත අවශ්‍යතා පහත හෙලන විට බැංකුවලට සැපයිය හැකි ණය ප්‍රමාණය වැඩිවීම නිසා රටේ සමස්ත ආයෝජන ඉහළ යාම.

03) රජයේ සුරැකුම්පත් අලෙවි කරන විට නව ආයෝජන අවස්ථා ඇතිවීම.

## පාරිභෝගික ආරක්ෂණය

පාරිභෝගිකයා ගෙවන මුදලට සරිලන තෘප්තියක් ලබා දීම සඳහා වෙළෙඳපොළ අක්‍රමිකතාවයන් ගෙන් සහ සෞඛ්‍යමය වශයෙන් සිදුවිය හැකි හානිවලින් පාරිභෝගිකයා මුදවා ගැනීමට නීති රීති අණපනත් හා පාරිභෝගික අධ්‍යාපනය තුළින් ලබාදෙන රැකවරණය පාරිභෝගික ආරක්ෂණයයි.

## වර්තමානයේ පාරිභෝගික ආරක්ෂණයේ අවශ්‍යතාව වැඩි වීමට හේතු

01 වෙළඳපල සංකීර්ණ වීම
02 තරගකාරී වර්ධනය වීම
03 විවෘත ආර්ථිකය
04 ගෝලීයකරණය
05 තාක්ෂණික දියුණුව
06 රාජ්‍ය සේවා පෞද්ගලිකරණය කිරීම
07 ශක්තිමත් පාරිභෝගික සංවිධාන නොමැතිවීම

## පාරිභෝගික ආරක්ෂණයේ වැදගත්කම

**පාරිභෝගිකයාට**

01 පාරිභෝගිකයා ගෙවන මුදලට සරිලන තෘප්තියක් ලබා ගත හැකිවිම.
02 වෙළෙඳ විෂමාචාර වලට එරෙහිව නීතිමය රැකවරණය ලබා ගත හැකි වීම.
03 සෞඛ්‍යමය හානි වලින් පාරිබොගිකයා ආරක්ෂා විම.
04 පාරිභෝගික අධ්‍යාපනය ලබාගත හැකිවිම.
05 ගුණත්වයෙන් උසස් මෙන්ම සාධාරණ මිලට භාණ්ඩ ලබා ගත හැකි විම.

**ව්‍යාපාරිකයාට**

01 පාරිභෝගික තෘප්තිය ඉහළ යාම
02 පිරිවැටුම වැඩිවී ලාභය ඉහළ යාම
03 වෙළඳපල සම්බන්ධතා වර්ධනය වීම
04 පාරිභෝගික පැමිණිලි අවම වීම
05 නිසි ප්‍රමිතියට අනුකූලව නිෂ්පාදනය කිරීම නිසා පිරිවැය අවම වීම

## පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග

01) ශක්තිමත් පාරිභෝගික ආරක්ෂණ නිති ස්ථාපිත කිරීම.

උදාහරණ:- පාරිබොගික කටයුතු පිළිබඳ අධිකාරි පනත

ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත

02) බලසම්පන්න පාරිබෝගික ආරක්ෂක ආයතන පිහිටුවිම.

උදාහරණ:- පාරිබෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

03) වෙළෙඳපොළ පදනම් කරගත් පාරිභෝගික ආරක්ෂණ වැඩපිළිවෙළවල් කරා යොමු විම.

උදාහරණ:- භාණ්ඩ හා සේවා වල උපරිම සිල්ලර මිල ගණන් නියම කිරීම.

ගුණත්වය සඳහා ප්‍රමිතීන් නියම කිරීම

ඇසුරුම් දැක්විය යුතු තොරතුරු නියම කිරීම

නිවිත භාණ්ඩ වර්ග නම් කිරීම

04) කර්මාන්තය පදනම් කරගත් පාරිභෝගික ආරක්ෂණ වැඩපිළිවෙළවල් සඳහා ප්‍රතිපත්ති සම්පාදනය

උදාහරණ:- තත්ව පාලන පද්ධති

ආචාර ධර්ම පද්ධති

ස්වයං පාළන ක්‍රියා පිළිවෙත්

05) වෙළෙඳපල සැපයුමට මැදිහත්වීම

06) පාරිභෝගික අධ්‍යාපනය නගා සිටුවිම

07) පාරිභෝගික සංවිධාන පිහිටුවීමට අනුබල දිම

## පාරිභෝගික ආරක්ෂණය සඳහා ව්‍යාපාර ආයතනයකට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග

01) ව්‍යාපාර ආචාරධර්ම සංග්‍රහයක් ස්ථාපිත කිරීම

02) වගකීම වර්ධනය කිරීම

03) විනිවිදභාවයෙන් යුක්තව කටයුතු කිරීම

04) වගකීම් සහතිකයක් නිකුත් කිරීම

05) ලේබලයක් මගින් අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරිම

06) බිල්පතක් ලබා දීම

07) සන්නම් නාමයක් යටතේ භාණ්ඩ වෙළඳ පොළට ඉදිරිපත් කිරීම

08) ජාතික හා අන්තර්ජාතික ප්‍රමිති ලබා ගැනිම

## පාරිභෝගිකයකුට ස්වකීය ආරක්ෂාව සලසා ගැනීම සඳහා අනුගමනය කල හැකි ක්‍රියාමාර්ග

01) ජාතික හා අන්තර්ජාතික ප්‍රමිති සහතිකය සහිත භාණ්ඩ මිලදි ගැනිම

02) ලේබලය පරීක්ෂා කොට බලා භාණ්ඩ මිලදී ගැනීම

03) ප්‍රකට සන්නම් නාමයක් සහිත භාණ්ඩ මිලදී ගැනීම

04) විශ්වාසවන්ත වෙළඳසැල් වේතින් භාණ්ඩ මිලදී ගැනිම

05) පාරිභෝගික සංවිධාන පිහිටුවා ගැනීම

06) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත යටතේ පාරිභෝගික ආරක්ෂා සලසා ගැනිම

07) ආරක්ෂා සඳහා සලසා ඇති විධිවිධාන අවබෝධ කරගැනීම

උදාහරණ:- බිල්පතක් ඉල්ලා සිටීම

වගකීම් සහතිකයක් ලබාගැනීම

## පාරිභෝගිකයකුට පාරිභෝගික ආරක්ෂාව සැලසෙන ප්‍රධාන ක්‍රම

01) ස්වං ආරක්ෂාව

02) පාරිභෝගික සංවිධාන තුළින් ලැබෙන ආරක්ෂාව

03) රාජයේ නීති රීති හා අණපනත් මගින් ලැබෙන ආරක්ෂාව

❖ **මෙයින් වඩාත් පලදායී ක්‍රමය වන්නේ ස්වං ආරක්ෂාව සලසා ගැනීමයි**

## පාරිභෝගික ආරක්ෂණයේ මට්ටම්

- ❖ පුද්ගලික මට්ටම - ස්වයං ආරක්ෂාව සලසා ගැනීම
- ❖ ප්‍රාථමික මට්ටම් /ප්‍රාදේශීය මට්ටම - පාරිභෝගික සංවිධාන හරහා ආරක්ෂාව සලසා ගැනීම
- ❖ ද්විතික මට්ටම /ජාතික මට්ටම - නීතිරීති අණපනත් හරහා ආරක්ෂාව සලසා ගැනීම
- ❖ තෘතික / ජාත්‍යන්තර මට්ටම - පාරිභෝගික ජාත්‍යන්තරය වැනි ජාත්‍යන්තර ආයතන හරහා ආරක්ෂාව සලසා ගැනීමයි

## පාරිභෝගික අයිතිවාසිකම්

ගෙවන මුදලට සාධාරණ තෘප්තියක් ලැබීම තහවුරු කිරීම සඳහා පාරිභෝගිකයා වෙත ප්‍රකාශ කර ඇති හිමිකම් පාරිභෝගික අයිතිවාසිකම් වේ.

අන්තර්ජාතික වශයෙන් පිළිගෙන ඇති පාරිභෝගික අයිතිවාසිකම් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රධාන පාර්ශව දෙකකි

**01** ඇමරිකා එක්සත් ජනපදය ජනාධිපතිවරයකු වූ ජෝන් එෆ් කෙනඩි මහතා
**02** පාරිභෝගික ජාත්‍යන්තරය

❖ **පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රථමයෙන් ප්‍රකාශ කරන ලද්දේ ජෝන් එෆ් කෙනඩි මහතාය. ඒ 1962 මාර්තු 15 වන දින එම දිනයි. එම දිනය සමරනු වස් ජගත් පාරිභෝගික දිනය හෙවත් පාරිභෝගික අයිතිවාසිකම් දිනය මාර්තු 15 වන දින සැමරේ.**

## අන්තර් ජාතික වශයෙන් පිළි පිළිගැනෙන ජෝන් එෆ් කෙනඩි මහතා විසින් ප්‍රකාශයට පත් කරන ලද පාරිභෝගික අයිතිවාසිකම් හතරකි

01) ආරක්ෂාව සලසා ගැනීමට ඇති අයිතිය

සෞඛ්‍යයට හා ජීවිතයට හානි කරවන භාණ්ඩ හා සේවා සැපයීමෙන් හෝ වෙළඳාමින් ආරක්ෂා වීමට ඇති අයිතියයි.

02) තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය

වංක හෝ නොමග යවන සුළු කටයුතු වලින් ආරක්ෂා වීම හා නැණවත් තෝරා ගැනීමක් සඳහා ඉවහල්වන සත්‍ය තොරතුරු දැන ගැනීමට ඇති අයිතියයි.

03) තෝරා ගැනීමට ඇති අයිතිය

තරගකාරි මිලගණන් යටතේ උසස් ප්‍රමිතීන් ගෙන් යුත් භාණ්ඩ හා සේවා තෝරා ගැනීමට ඇති අයිතියයි.

04) සවන් යොමු කරවා ගැනීමට ඇති අයිතිය

රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේදී පාරිභෝගික අවශ්‍යතාවයන් සහ අදහස් උදහස් ඉදිරිපත් කිරීමට හා ඒවාට ඇහුම්කන් ලබා දීමත් ලබාගැනීමට ඇති අයිතියයි.

**පාරිභෝගික ජාත්‍යන්තරය නම් පාරිභෝගික සංවිධානය විසින් අවධානය කෙරෙන පාරිභෝගික අයිතිවාසිකම් 08කි. ඉහත අයිතිවාසිකම් 04ට අමතරව පහත අයිතිවාසිකම් 04 ද ඊට ඇතුළත් වේ.**

05) මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය

පාරිභෝගිකයින්ගේ පැවැත්ම තහවුරු කෙරෙන මූලික අවශ්‍යතා වන ආහාරපාන ඇඳුම් නිවාස සනිපාරක්ෂක සේවා යනාදිය ලබා ගැනීමට ඇති අයිතියයි.

06) සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත්වීමට ඇති අයිතිය

පුද්ගලයින්ගේ ජීවිතයට අනතුරුදායක හෝ තර්ජනාත්මක නොවන අභිමානවත් සහ යහපත් දිවිපෙවෙතක් ගත කිරීමට ඉඩ සලසන්නා වූ පරිසරයක ජීවත්වීමට හා රැකියාවක් කිරීමට ඇති අයිතියයි.

07) වන්දි ලබාගැනීමට ඇති අයිතිය

අසතුටුදායක සේවා ව්‍යාජ තොරතුරු බාල භාණ්ඩ සැපයීමෙන් සිදුවන අසහනයන්ට වන්දි හෝ සහන ලබා ගැනීමට ඇති අයිතියයි.

08) පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය

නැණවත් පාරිභෝගිකයකු වශයෙන් කටයුතු කිරීමට අවශ්‍ය දැනුම සහ කුසලතා ලබා ගැනීමට ඇති අයිතියයි

## පාරිභෝගික වග්කීම් / යුතුකම්

නීතියෙන් සලසා ඇති පාරිභෝගික අයිතිවාසිකම් රැක ගැනීම සඳහා සංවිධානය වීම හා ක්‍රියා ක්‍රියාත්මක වීමේ යුතුකමයි. පාරිභෝගික ජාත්‍යන්තරය විසින් ප්‍රකාශයට පත් කරන ලද පාරිභෝගික වගකීම් කිහිපයකි.

**01** විචාරාත්මක දැනුවත්භාවය
භාණ්ඩ හා සේවාවන්හි ගුණාත්වය හා මිල පිළිබඳ ප්‍රශ්න කිරීම සහ සෝදිසියෙන් සිටීමයි

**02** ක්‍රියාකාරී සහභාගිත්වය
යුක්ති සහගත සහ සාධාරණ ගනුදෙනු සඳහා ක්‍රියා කිරීම සහ පාරිභෝගික අයිතීන් සහ බලය තහවුරු කිරීමට කටයුතු කිරීමයි.

**03** සහයෝගීතාවය / එක්සත්ව කටයුතු කිරීම.
පාරිභෝගික ආරක්ෂණය නැන්වීමට බලපෑම් කිරීම සඳහා පාරිභෝගිකයින් එක්සත්ව සංවිධානය වීමයි.

**04** සමාජය ගැන සැලකිලිමත් වීම
අපගේ පරිභෝජන රටාවන් අනිකුත් පුද්ගලයන්ට සහ කණ්ඩායම් වලට ඇතිවන බලපෑම් පිළිබඳව සැලකිලිමත් වීමයි.

**05** පරිසරය පිළිබඳව සැලකිලිමත් වීම / පාරිසරික දැනුවත්භාවය

අනාගත ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීම සඳහා අපගේ පාරිභෝගික රටාවන් පරිසරයට වන බලපෑම් පිළිබඳව සැලකිලිමත් වීමයි.

## පාරිභොගිකයින් පාරිභෝගික වගකීම් ඉටුකිරිම තුළින් ඉටුවන පාරිභෝගික අයිතිවාසිකම්

| පාරිභෝගික වගකීම් | පාරිභෝගික අයිතිවාසිකම් |
|---|---|
| ක්‍රියාකාරී සහභාගිත්වය | ආරක්ෂාව සලසා ගැනීම<br>වන්දි ලබාගැනීම |
| විචාරාත්මක දැනුවත්භාවය | තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය |
| සහයෝගීතාවය | ආරක්ෂාව සලසා ගැනිම<br>වන්දි ලබාගැනීම |
| සමාජය ගැන සැලකිලිමත් විම | මූලික අවශ්‍යතා සපුරා ගැනිම<br>සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත්වීම |
| පාරිසරික දැනුවත්භාවය | සෞඛ්‍යසම්පන්න පරිසරයක ජීවත්වීම |

## පාරිභෝගික අධ්‍යාපනය

නැණවත් පාරිභෝගිකයකු වශයෙන් කටයුතු කිරීමට අවශ්‍ය දැනුම කුසලතා ලබා ගැනීමයි. එනම් පාරිභෝගිකයකු සතු අයිතිවාසිකම් සහ ඔහුගේ වගකීම් යනාදිය පිළිබඳ තොරතුරු සැපයීමෙන් ඔහුව දැනුවත් කිරීමයි.

## පාරිභෝගික අධ්‍යාපනය තුළින් පාරිභෝගිකයායා ආරක්ෂා වන ආකාරය

නැණවත් පාරිභෝගිකයකු වීමෙන් තමන් ගෙවන මුදලට සරිලන ගුණාත්මක භාණ්ඩ හා සේවා මිලදී ගැනීම්ට හැකිවීමෙන් තමන් ආරක්ෂා වන අතරම පාරිභෝගිකයකු වශයෙන් තමා සතු යුතුකම් නිසි ලෙස ඉටු කිරීමෙන් අනෙකුත් පාරිභෝගිකයන් ද ආරක්ෂා වේ.

## පාරිභෝගික ආරක්ෂණය වෙනුවෙන් ක්‍රියාත්මක වන විදේශීය ආයතන

01) පාරිභෝගික ජාත්‍යන්තරය.

- ලෝකයේ වෙසෙන සියලු පාරිභෝගික ජනතාවගේ අයිතීන් රැක ගැනීම සඳහා කටයුතු කරන ප්‍රධානතම ආයතනයයි.
- රටවල් 115ක පමණ ක්‍රියාත්මක වන පාරිභෝගික සංගම් 220ක සාමාජිකයින් ලෙස නියෝජනය කරන අන්තර්ජාතික ආයතනයයි.
- 1960 අප්‍රේල් මස 01 දින ආරම්භ කරණ ලද මෙය එවකට අන්තර්ජාතික පාරිභෝගික සමිති සම්මේලනය ලෙස හැඳින්විය.
- 1995 වර්ෂයේ සිට මෙය පාරිභෝගික ජාත්‍යන්තරය ලෙස හැඳින්විය.
- මෙහි ප්‍රධාන කාර්යාලය එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර පිහිටා ඇත.

02) අන්තර්ජාතික ප්‍රමිති සංවිධානය (ISO)

- ලොව පුරා සියලු කලාපයන් නියෝජනය වන පරිදි රටවල් 163 ක ජාතික ප්‍රමිති ආයතනයන්ගෙන් සමන්විත අන්තර්ජාතික ආයතනයයි.
- සියළුම ආකාරයේ ව්‍යාපාර මෙහෙයුම් වලට වටිනාකම් එක්කරන ස්වෙච්චා තාක්ෂණික ප්‍රමිති සම්පාදනය දැනුම් හුවමාරුව, තාක්ෂණික නවෝත්පාදනය මෙහි මූලික කාර්යය වේ.
- 1947 පෙබරවාරි 23 වන දින ආරම්භ කරන ලද මෙය රාජ්‍ය නොවන සංවිධානයකි.
- මෙය ස්විට්ලන්තයේ ජිනීවා නුවර පිහිටා ඇත.

03) එක්සත් ජාතීන්ගේ සංවිධානය

පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ එක්සත් ජාතින්ගේ මාර්ගෝපදේශය ප්‍රකාශයට පත් කිරීමත් සහ බහුජාතික සමාගම් විසින් පිළිපැදිය යුතු හැසිරීම් සංග්‍රහයක් ප්‍රකාශයට පත් කිරීම යන ආදිය තුළින් පාරිභෝගික ආරක්ෂණය වෙනුවෙන් කටයුතු කරයි.

## පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරන දේශිය ආයතන

01) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

02) පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

03) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

04) මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

05) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

06) ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය

## පාරිභෝගික යුතු පිළිබඳ අධිකාරිය

- පාරිභෝගිකයන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සහ සාධාරණ වෙළඳපල තරගකාරීත්වයක් ඇති කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රධාන බලදාරී ආයතනයයි.

- 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත යටතේ මෙය පිහිටුවා ඇත.

- සදාචාරාත්මක ව්‍යාපාර පරිසරයක් තුළ සුරක්ෂිත වූ පාරිභෝගිකයකු බිහි කිරීම මෙහි දැක්ම වේ.

## පාරිභෝගික යුතු පිළිබඳ අධිකාරියේ සංයුතිය

අධිකාරියේ සභාපතිවරයෙකු ගෙන් සහ කර්මාන්ත, නිතිය, ආර්ථිකය විද්‍යාව, වාණිජ්‍ය, පරිපාලනය, ගිණුම්කරණය, විද්‍යාව හා සෞඛ්‍ය යනාදී ක්ෂේත්‍රවල සුදුසුකම්ලබා ඇත්තා වූද ඒ ඒ ක්ෂෙත්‍ර වල පෘථුල පළපුරුද්දක් හා විශිෂ්ටත්වයක් ලබා ඇත්තාවූද තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත්කරන ලද 10කට නොඅඩු සාමාජිකයෙක් සංඛ්‍යාවක ගෙන් සමන්විත වේ එහි සභාපතිවරයාට අමතරව වෙනත් සාමාජිකයින් තිදෙනකු පූර්ණ කාලීණ සාමාජිකයින් ලෙස පත් කරන අතර ඔහුන් ඇතුලු සියලු දෙනා අවුරුදු 03ක කාල සීමාවකට පත් කරන අතර සභාපතිට අමතරව මෙහි අධ්‍යක්ෂක ජෙනරාල් වරයෙක් සිටි. ඔහු අධිකාරියේ ලේකම්වරයා වේ.

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු

01) පාරිභෝගික ජීවිත හා දේපලවලට හානි කරවන භාණ්ඩ හා සේවා සැපයීමට එරෙහි වීම.

02) පාරිභෝගිකයා ආරක්ෂා කිරිම සහ පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ සැළකිලිමත් වීම.

03) හැකි සෑම විටම තරගකාරී මිලට භාණ්ඩ හා සේවා ලබාදීමට කටයුතු කිරීම.

04) අසාධාරණ වෙළද පිළිවෙත් මගින් සිදුකරන පාරිබොගික සූරාකෑම් වලට එරේහිව සහනයක් ලබාදීම.

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යයන්

01) වෙළඳුන් අතර සීමාකාරී වෙළද ගිවිසුම් පාලනය කිරීම.

02) ඒකාදිකාරී තත්ත්වයන් පාලනය කිරීම.

03) අහිතකර තරගකාරීත්වය වැළැක්වීම.

04) පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

05) පාරිභෝගික සංවිධාන පිහිටුවීම අනුබල දීම.

06) පාරිභෝගික අධ්‍යාපනයය ප්‍රවර්ධනය කිරීම.

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සතු බලතල

01) වෙළඳුන් ගේ අවශ්‍ය තොරතුරු ඉල්ලා සිටීම.

02) ජන ජීවිතයට අත්‍යාවශ්‍ය යැයි සිතන භාණ්ඩ නිශ්චිත භාණ්ඩ ලෙස නම් කිරීම.

03) පාරිභෝගික භාණ්ඩ හා සේවා සැපයීම පිළිබඳ ප්‍රමිති ඇතිකිරීමට අනුබල දීම.

04) වැරදි සිදුකරන වෙළෙදුන් අත්අඩංගුවට ගැනීම.

05) පාරිභෝගික පැමිණිලි පිළිබද පරික්ෂා කිරීම.

## පාරිභෝගික ආරක්ෂණයට අදාළ පනත්

01) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත

02) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත

03) 1980 අංක 26 දරන ආහාර පනත

04) 1995 අංක 35 දරණ මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනත

05) 1984 අංක 6 දරණ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත

## 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත

පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියා ක්‍රියාත්මක වන ප්‍රධානතම නීතියයි.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත සම්මත වීමත් සමග උහොසි වූ පනත් 03කි.

01) 1979 අංක 01 දරණ පාරිභෝගික ආරක්ෂණ පනත

02) 1987 අංක 01 දරණ සාධාරණ වෙළෙඳ කොමිසන් සභා පනත

03) මිල පාලන පනත

පාරිභෝගික කටයුතු පිළිබඳ නව පනත සම්මත වීමත් සමඟ අහෝසි වූ ආයතන 02කි.

01) අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව

02) සාධාරණ වෙළෙඳ කොමිෂන් සභාව

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත සම්මත කිරීමේ අරමුණු

01) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ස්ථාපිත කිරීම

02) පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව පිහිටුවීම

03) අභ්‍යන්තර වෙළඳාම විධිමත් කිරීම

04) පාරිභෝගික ආරක්ෂණ පනත, සාධාරණ වෙළඳ කොමිසන් සභා පනත, මිල පාලන පනත අහෝසි කිරීම.

05) ඵලදායි තරගකාරීත්වයක් ඇති කිරීම හා පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීම.

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතට අනුව වෙළඳුන් විසින් සිදු කිරීමටට ඉඩ ඇති වැරදි

01) විකිණීමට ඇති භාණ්ඩ විකිණීම ප්‍රතික්ෂේප කිරීම.

02) භාණ්ඩවල ඇතුළත් ලේබල් විකෘති කර මකා දැමීම.

03) ලේබල් කිරීම අනිවාර්ය භාණ්ඩ වල ලේබල් ඇතුළත් නොකිරීම.

04) උපරිම මිල නියම කර ඇති භාණ්ඩ එම මිලට වඩා වැඩි මිලකට විකිණීම.

05) විකිණීමට ඇති භාණ්ඩවල කොන්දේසි ඉදිරිපත් කර විකිණීම හෝ ප්‍රතික්ෂේප කිරීම. (**''මිල නොපමාව ගෙවන්න''** පමණක් ඉදිරිපත් කළ හැක.)

06) තම වෙළඳ අවශ්‍යතාවයට වඩා වැඩි භාණ්ඩ ප්‍රමාණයක් තමා සංන්තකයේ තබාගැනීම.

07) නියම කර ඇති ප්‍රමිතියට හෝ තත්ත්වයට නොගැලපෙන භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය.

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත ට අනුව වෙළඳුන් විසින් පිළිපැදිය යුතු නියමයන්

01) විකිණීමට ඇති භාණ්ඩ විකිණීම ප්‍රතික්ෂේප කිරීමෙන් වැළකීම.

02) භාණ්ඩ විකිණීමේදී **''මිල නොපමාව ගෙවිය යුතුය''** යන කොන්දේසිය හැර වෙනත් කොන්දේසි ඉදිරිපත් නොකිරීම.

03) තම පෞද්ගලික පරිභෝජනය හා වෙළෙඳ අවශ්‍යතාවයන් ඉක්ම වන ආකාරයෙන් තොග ළඟ තබා නොගැනීම.

04) උපරිම සිල්ලර මිල ගණන් හා තොග මිල ගනන් දැක්වෙන මිල ලැයිස්තුවක් ප්‍රදර්ශනය කිරීම.

05) භාණ්ඩවල ගැනුම්කරු විසින් ඉල්ලා සිටින විට කුවිතාන්සියක් නිකුත් කිරීම.

06) අධිකාරිය විසින් නිකුත් ලබන නිවේදන හා විධානයන් ප්‍රදර්ශනය කිරීමට දැන්වීම් පුවරුවක් පවත්වාගෙන යාම.

## අසාධාරණයට ලක් වූ පාරිභෝගිකයන්ට පාරිභෝගික අධිකාරියෙන් ලබා ගත හැකි සහන

01) වන්දි ගෙවීම

02) භාණ්ඩ මාරු කිරීම

03) අලුත්වැඩියා කර දීම

04) වගකීම් සහතිකයක් ලබා දීම

05) ගෙවන ලද මුදල් ආපසු ලබා දීම

06) දෝෂ සහිත භාණ්ඩ වෙළෙඳ පොළෙන් ඉවත් කිරීම

## පාරිභෝගික ආරක්ෂණ නීති කඩකල වෙළඳුන් සඳහා පාරිභොගික අධිකාරිය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග

01) අවවාද කිරීම

02) මූල්‍යමය දඩ නියම කිරීම

03) අගතියට පත් පාර්ශවයට වන්දි ගෙවීම්ට නියම කිරීම

04) වෙළඳසැල්වලට මුද්‍ර තැබීම

06) බන්ධනාගාර ගත කිරීම

07) භාණ්ඩයකට භාණ්ඩයක් ලබාදීම හෝ මුදල් ආපසු ලබා දීම

08) ව්‍යාපාරය වසා දැමීම වැනි දඬුවම් දීමට උසාවියෙන් නියොග ලබාදීම

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතට අනුව විකුණුම්කරු නිකුත් කරන කුවිතාන්සියක දැක්විය යුතු තොරතුරු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ **28 වගන්තිය** අනුව යම් භාණ්ඩයක් විකුණන සෑම වෙළෙන්දකු විසින්ම ගැනුම්කරු ඉල්ලා සිටින විටෙකදි කුවිතාන්සියක් නිකුත් කළ යුතුය. එම කුවිතාන්සියේ දැක්විය යුතු තොරතුරු කිහිපයකි.

01) විකිණීම කළ දිනය

02) විකුණන ලද භාණ්ඩ ප්‍රමාණය

03) එම ප්‍රමාණය සඳහා ගෙවන මිල

04) ගනුදෙනුවේ ස්වභාවය එනම් තොග ද සිල්ලර ද යනවග

05) කුවිතාන්සියක දැක්විය යුතු යැයි වෙනත් නීතියකින් සම්මත කරගත් නියෝග

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් ප්‍රකාශ කර ඇති නිශ්චිත භාණ්ඩ

යම් භාණ්ඩයක් හෝ සේවාවක් ප්‍රජාවගේ හෝ එහි යම් කොටසකගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය බව අමාත්‍යවරයාගේ මතය වූ අවස්ථාවක පාරිභෝගික අධිකාරියේ මතය ද ලබාගෙන එම භාණ්ඩ නිශ්චිත භාණ්ඩ ලෙස ගැසට් මගින් ප්‍රකාශ කළ හැක. පනතේ 18 වන වගන්තිය මගින් ඒ සඳහා අවසර දී ඇත. මෙලෙස නිශ්චිත භාණ්ඩ ලෙස නම් කිරීමේ ඇති වැදගත්කම වනුයේ එකී භාණ්ඩවල මිල ගනන් අධිකාරියේ පූර්ව අවසර තොරව වැඩි කළ නොහැකි වීමයි. එලෙස ප්‍රකාශයට පත් කර ඇති භාණ්ඩ වර්ග කිහිපයකි.

01) කිරිපිටි
02) මුං ඇට
03) සහල්
04) ලොකු ලූණු
05) හාල් මැස්සන්
06) පරිප්පු
07) සිමෙන්ති
08) කුකුල් මස්
09) රතු ලූණු
10) වියලි මිරිස්
11) ගෑස්
12) සුදු සීනි

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත යටතේ ලේබලයක ඇතුළත් විය යුතු තොරතුරු

පනතේ 10 (1) වගන්තිය අනුව ලේබලයක දැක්විය යුතු ප්‍රධාන තොරතුරු කිහිපයකි.

01) උපරිම සිල්ලර මිල

02) නිෂ්පාදිත දිනය

03) කල් ඉකුත්වන දිනය

04) බර හෝ ප්‍රමාණය

05) නිෂ්පාදිත භාණ්ඩ අංකය

## ඇසුරුම් නියෝග වලට යටත් භාණ්ඩ

01) චොකලට්
02) විස්කෝතු
03) මාගරින්
04) චට්නි වර්ග
08) ළදරුවන් සඳහා ආහාර
09) ටින් මාළු
10) ටින් කළ පලතුරු
11) කෘෂි පොහොර
15) යෝගට්
16) කිරිපිටි
17) කෘෂි රසායන

05) සිමෙන්ති 12) උකු කළ කිරි

06) රෝගීන් සඳහා ආහාර 13) සිසිල් බීම

07) අයිස්ක්‍රීම් 14) බටර්

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ නීති කඩකිරීම සම්බන්ධයෙන් දැනුම් දිය යුතු පාර්ශවය

යම් භාණ්ඩයක් හෝ සේවාවක් මිල දී ගැනිමේදි නොමග යැවීමක් හෝ වංචාකාරි ක්‍රියාවකට පාරිභෝගිකයා හසුවී ඇත්නම් පාරිභෝගික කටයුතු පිළිබඳ අදිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල් / ලේකම් සහ සභාපති වෙත පැමිණිල්ල යොමු කළ හැක. එම පැමිණිල්ල අදාළ ලිපි ලේඛන හෝ අනිකුත් සාක්ෂි සමග ලිඛිතව මිලදී ගත් දින සිට මාස 03ක් ඇතුළත ඉදිරිපත් කළ හැක.

## පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

කටයුතු පිළිබඳ අධිකාරී පනත යටතේ පිහිටුවා ඇති සභාවකි. පාරිභෝගික පැමිණිලි විමර්ශනය කරන මෙම මණ්ඩලය පුද්ගලයින් 03කු ගෙන් සමන්විත වේ.

## පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ සංයුතිය

- වාණිජ නීතිය පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇති තැන්ත්තෙකු.
- ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇති තැන්ත්තෙකු
- වෙළෙද පිළිවෙත් සහ පාරිභෝගික කටයුතු පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇති තැන්ත්තෙකු

වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරන ලද මෙම තිදෙනාගෙන් අධිකාරිය සමන්විත වන අතර ඉන් එක් අයෙකු සභාපති වශයෙන් පත්කරන අතර ඊට අමතරව ඊට අමතරව ලේකම් වරයෙකු සිටි.

## පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ කාර්යභාරය

01 තරඟ විරෝධී චර්යා විමර්ශනය කර වාර්තා කිරීම
02 සභාව වෙත ඉදිරිපත් කරන පැමිණිලි විභාග කිරීම

## තරඟ විරෝධී චර්යා

කිසියම් ව්‍යාපාරයට හෝ පුද්ගලයෙකුට තරගකාරි ලෙස නිස්පාදනය, සේවා සැපයීම සහ ලබා ගැනීම සම්බන්ධයෙන් වන සීමාකිරීම්, විකෘති කිරීම් හෝ වැළැක්වීම් සිදුකිරීමයි.

උදාහරණ:- මිල කිරීම් වෙනස් කිරීම

සීමාකාරී කොන්දේසි මත ගනුදෙනු

## පාරිභෝගික සංවිධාන

පාරිභෝගික අයිතිවාසිකම් දිනා ගැනීම සහ ආරක්ෂා කර ගැනීම සඳහා මෙන්ම පාරිභෝගික අධ්‍යාපනය නංවාලීම සඳහා ප්‍රාදේශීය වශයෙන් එක්වී ස්වේච්ඡාවෙන් පිහිටුවා ගනු ලබන සංවිධානාත්මක සමිති විශේෂයකි.

## පාරිභෝගික සංවිධානයක කාර්යභාරය

01 පාරිභෝගිකයාට ප්‍රයෝජනවත් තොරතුරු ප්‍රචලිත කිරීම.
02 පාරිභෝගික අධ්‍යාපනය නගා සිටුවීමට කටයුතු කිරීම.
03 ප්‍රාදේශීය පාරිභෝගික ප්‍රශ්න පිළිබඳ රජයට කරුණු ලබාදීම.
04 පාරිභෝගික යහපත උදෙසා යම් යම් ආධාර ලබාදීම.

## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)

ශ්‍රී ලංකාවේ ප්‍රමිති කරණ කටයුතු ප්‍රචලිත කිරීම සහ කර්මාන්ත ආශ්‍රිත ක්ෂේත්‍රයන් හි තත්ව කළමනාකරණ කටයුතු ප්‍රචලිත කිරීම සඳහා ආරම්භ කොට ඇති ආයතනයයි.

1964 අංක 38 දරණ ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යංශ පනතින් ස්ථාපිත කල ප්‍රමිති කාර්යාංශය 1984 අංක 6 දරණ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත හඳුන්වා දීමෙන් පසු ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නමින් ක්‍රියාත්මක වේ.

- ප්‍රමිති කරණයේ පියා ඇමරිකානු ජාතික එලී විට්නි මහතා ය.
- ලෝක ප්‍රමිති දිනය ඔක්තෝම්බර් 14 සැමරෙයි.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අන්තර්ජාතික ප්‍රමිති ආයතනයේ ශ්‍රී ලංකාවේ ජාතික සාමාජික ආයතනයයි.

## ශ්‍රී ලංකා ජාතික තත්ත්ව සම්මානය

විශිෂ්ට තත්වයෙන් යුත්තව භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන සුළු මධ්‍ය හා මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් වාර්ෂිකව පිරිනමනු ලබන සම්මානයයි. ශ්‍රී ලාංකීය සංවිධානවල විශිෂ්ට තත්ව කළමනාකරණ ක්‍රියාවලින් පිළිගැනීමට ලක්කරන වාර්ෂික වැඩ පිළිවෙළයි.

## ප්‍රමිති

නිෂ්පාදනයේත්, පාරිභෝජනයේත්, වෙළඳාමේත්, උපරිම කාර්යක්ෂමතාව උදෙසා විද්‍යාවේත්, තාක්ෂණයේත්, පළපුරුද්දේත්, ඒකාබද්ධ ප්‍රතිඵල කැටි කොට අදාල සියලුම අංශවල පොදු අනුමැතියෙන් සහ ඒකමතික භාවයෙන් යුක්තව පිළියෙල කොට ජාතික, කලාපීය හෝ අන්තර්ජාතික වශයෙන් පිළිගත් ආයතනයක් විසින් අනුමත කර මහජනයා වෙත ඉදිරිපත් කරනු ලබන තාක්ෂණික පිරිවිතරයකි.

## ප්‍රමිතියකින් අත්වන ප්‍රතිලාභ

S - Saving money මුදල් ඉතිරි වීම.

T - Time saving කාලය ඉතිරි විම.

A - Accident prevention අනතුරු වැලකීම.

N - No bais අපක්ෂපාතී බව.

D - Defind quality තත්ත්වය අර්ථ දැක්වීම.

A- Argument avoided අවිවාදයෙන් මිලදී ගත හැකිවීම.

R- Reliability assurvd විශ්වාසය තහවුරු වීම.

D- Delivery in time නිසි වෙලාවට බෙදා හැරීම.

S - Saving resources සම්පත් ඉතිරිවීම.

## ජාතික ප්‍රමිති පද්ධතියක් ක්‍රියාත්මක කිරීමෙන් රටට අත්වන ප්‍රතිලාභ

01 ගුණාත්මක නිෂ්පාදිත නිපදවීමට හැකියාව ලැබීම.
02 අපතනය සහ නාස්තිය අවම වීම.
03 පාරිභෝගික ආරක්ෂාව තහවුරු වීම.
04 පාරිභෝගික සෞඛ්‍යය තහවුරු විම.
05 පාරිභෝගික දැනුවත් භාවය තහවුරු විම.
06 රටේ සම්පත් කාර්‍යශමව උපයෝජනය වීම.
07 අපනයනය වර්ධනය කරගත හැකිවීම.

## ප්‍රමිතිකරණය

විද්‍යාව, තාක්ෂණය, ආර්ථිකය යන ක්ෂෙත්‍රයන්හි හට ගන්නා ප්‍රශ්න සඳහා නැවත නැවතත් යෙදීමට හැකි යෝග්‍යතම විසදම් ක්‍රියාපිළිවෙල ප්‍රමිතිකරණයයි.

මෙහි ප්‍රධාන අංග 03කි

01 ප්‍රමිති සකස් කිරීම.
02 ප්‍රමිති නිකුත් කිරීම.
03 ප්‍රමිති ක්‍රියාත්මක කිරීම.

## ප්‍රමිතිකරණයේ මට්ටම්

01) පුද්ගල ප්‍රමිති

යමෙක් එදිනෙදා කටයුතු ක්‍රමානුකූලව කරගෙන  කරගෙන යාම සඳහා පිළියෙල කරන ප්‍රමිති වේ. ඕනෑම පුද්ගලයෙකුට තම කාර්යයන් ක්‍රමවත්ව කර ගැනීම සඳහා තමාට ආවේණික පුද්ගල ප්‍රමිති සකස් කරගත හැකිය.

උදාහරණ:- පාසල් ශිෂ්‍යයකු තම එදිනෙදා කටයුතු ක්‍රමානුකූලව පවත්වා ගෙන යාමට භාවිතා කරන කාලසටහන්

02) සමාගම් ප්‍රමිති

කිසියම් ආයතනයක හෝ සමාගමක සියලුම ක්‍රියාවන් සඳහා සකස් කරගත් ප්‍රමිති වේ. මේවා අභ්‍යන්තර ප්‍රමිති ලෙස හඳුන්වයි. නිරවුල් භාවය ඇති කරගැනිම, පිරිවැය අඩුකර ගැනීම, ඵලදායිතාව වැඩි කර ගැනිම මෙම ප්‍රමිති වල අරමුණු වේ.

03) කර්මාන්ත ප්‍රමිති

යම් ක්ෂේත්‍රයකට අයත් නිෂ්පාදකයින් හා වෙළඳුන් එක්තු වී සකස් කරගත් ප්‍රමිති වේ.

උදාහරණ:- ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ සංගමය විසින් සකස් කර ඇති ප්‍රමිති

04) ජාතික ප්‍රමිති

කර්මාන්ත හා වානිජ්‍යයේ යොදා ගැනීම සඳහා සකස් කර ගන්නා ප්‍රමිති වේ. ශ්‍රී ලංකාවේ දී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් මේවා පිළියෙල කරයි.

උදාහරණ:- SLS

05) කලාපීය ප්‍රමිති

රටවල් කිහිපයක් එක්තු වී සකස් කරන ප්‍රමිති වේ.

උදාහරණ:- යුරෝපා සංගමයට අයත් ප්‍රමිති

06) අන්තර් ජාතික ප්‍රමිති

අන්තර් ජාතික වශයෙන් භාණ්ඩ හුවමාරුව නිරාකරණය කිරීම, සන්නිවේදනය පහසු කිරීම, පාරිභෝගික ආරක්ෂාව සැලසීම, අන්තර්ජාතික වෙළඳාමට ඇති බාධක ඉවත් කිරීම ආදී අරමුණු ඇතිව සකස් කරන ලද ප්‍රමිති වේ.

උදාහරණ:- ISO ප්‍රමිති

## **<u>ප්‍රමිතිකරනයේ අරමුණු</u>**

01 රටක සමස්ත ආර්ථික සංවර්ධනය
02 පාරිභෝගික ආරක්ෂාව
03 පාරිභෝගික සෞඛ්‍ය ආරක්ෂාව
04 සන්දේශන වර්ධනය

## ශ්‍රී ලංකා ප්‍රමිතිය ආයතනය විසින් ප්‍රමිති ක්‍රියාත්මක කරන ආකාරය

01) ස්විචාවේන් පිළිපැදීම මගින්

ප්‍රමිතිවලට අනුකූලව භාණ්ඩ නිෂ්පාදනය බලපෑමක් නොමැතිව නිශ්පාදකයා කැමැත්තෙන්ම සිදු කිරීමයි.

02) SLS භාණ්ඩ සහතික කරනයේන්

03ආනයනික පරීක්ෂාව මගින්

මෙරටට ආනයනය කරන ලද භාණ්ඩ වෙළෙඳ පොළට නිකුත් කිරීමට පෙර ප්‍රමිති ආයතනය මගින් සිදුකර ගත යුතු පරීක්ෂාවයි.

04) පූර්ව අපනයන පරීක්ෂණ මගින්

ව්‍යාපාර කෘෂි නිෂ්පාදන අපනයනය කිරීමට පෙර ස්වේච්චා පදනමකින් ප්‍රමිති ආයතනය මගින් කරවා ගත යුතු පරීක්ෂාවයි.

05) අපනයනය සඳහා මුහුදු ආහාර ඇසුරුම් ආයතන පරීක්ෂාව මගින්

අපනයනය කරන මුහුදු ආහාර සඳහා අවශ්‍ය සෞඛ්‍ය සහතික ලබාගැනීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේන් ලබා ගත යුතු ඇසුරුම් කරන පරික්ෂාවයි.

## ශ්‍රී ලංකා ප්‍රමිතිය ආයතනය විසින් ක්‍රියාත්මක කරන ප්‍රමිති

01) SLS භාණ්ඩ සහතිකරණය.

02) ISO 9001-2015 තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකකරණය.

03) ISO 14001-2015 පරිසර කලමනාකරණ පද්ධති සහතිකකරණය.

04) ISO 22000-2005 ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති සහතිකකරණය.

05) ISO 50001-2011 බලශක්ති කළමනාකරණ පද්ධති සහතිකකරණය.

06) ISO 26000-2010 සමාජ වගකීම් මාර්ගෝපදේශය.

07) SA-8000 සමාජ වගකීම් පිළිබඳ සහතිකකරණය.

08) ISO 18001-2007 වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති

සහතිකකරණය.

09) HACCP සහතිකකරණය

උපද්‍රව විශ්ලේෂණ හා අවධි පාලන අවස්ථා

10) GMP සහතිකකරණය.

යහපත් නිෂ්පාදන පරිචයන් සහතිකකරණය.

11) ISO 27001-2013 තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධති සහතිකකරණය.

12) තේ නිපැයුම් සහතිකකරණය. (PST)

13) සුපිරි වෙළඳසැල් කළමණාකරන සහතිකකරණය. (SMCS)

14) කාබනික කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රියාවලි පද්ධති සහතිකකරණය.

15) නිර්මාංශ ආහාර පද්ධති සහතිකකරණය.

16) ශක්ති කාර්යක්ෂමතා ලේබලය.

17) විදාතා පද්ධති සහතිකකරණය.

## SLS භාණ්ඩ සහතිකකරණය.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට අනුකූලව භාණ්ඩ නිෂ්පාදනය කර ඇති බවට එම ආයතනය විසින් නිකුත් කර ඇති සහතිකයයි. මෙමගින් භාණ්ඩයේ ගුණත්වය පිළිබඳ තෙවන පාර්ශවයේ වගකීමක් දෙනු ලැබේ.

## SLS ලාංඡන ක්‍රමය සිය නිශ්පාදිත සඳහා ලබාගැනීමට නිෂ්පාදකයකු සපුරාලිය යුතු මූලිකාංග

01) නිවැරදි ක්‍රියාවලින් පාලනයක් පැවතීම.

02) නිවැරදි කළමනාකරණයය ක්‍රමයක් පැවතීම.

03) නිවැරදි ඇසුරුම් ක්‍රමයක් පැවතීම.

04) නිවැරදි සේවක පුහුණු කිරීමේ ක්‍රමයක් පැවතීම.

05) නිවැරදි තත්ව පාලන ක්‍රමයක් පැවතීම.

06) තත්ව පාලන වාර්තා පවත්වාගෙන යාම.

07) අභ්‍යන්තර තත්ව විගණන ක්‍රමයක් පවත්වාගෙන යාම.

## SLS ලාංඡනය පිරිනැමීමේ පරමාර්ථ

01) දේශීය නිෂ්පාදිතයන්ගේ ගුණත්වය ඉහළ නැංවීමට.

02) ගුණත්වයෙන් ඉහල භාණ්ඩ හඳුනා ගැනීමට පාරිභෝගිකයාට උදව් කිරීම.

03) ගුණත්වයෙන් ඉහළ භාණ්ඩ නිෂ්පාදනයටත් ඒවායේ තත්ත්වය රැක ගැනීමටත් නිශ්පාදකයා උනන්දු කිරීම.

## SLS ලාංඡන ක්‍රමය මගින් නිෂ්පාදකයාට අත්වන වාසි

01) විකුනුම් වර්ධනය වීම

02) ගුණාත්මකභාවය වැඩි වීම තුළින් කීර්තිනාමය ඉහළ යාම

03) ප්‍රවර්ධනය පහසුවීම

04) තරගයට සාර්ථකව මුහුණ දිය හැකි වීම

05 අපතනය සහ නාස්තිය අවම වීම
06 ලාභය ඉහළ යාම

## SLS ලාංඡන ක්‍රමය මගින් පාරිභෝගිකයාට ප්‍රතිලාභ

01) තෝරා ගැනීම පහසු වීම

02) ගෙවන මුදලට සරිලන තෘප්තියක් ලබාගත හැකිවීම.

03) පාරිභෝගික ආරක්ෂාව තහවුරු වීම.

04) ගුණයෙන් උසස් භාණ්ඩ පරිභෝජනය කිරීමට අවස්ථාව හිමිවීම

## SLS ලාංඡනය අනිවාර්ය භාණ්ඩ වර්ග

01) ආහාර නිෂ්පාදිත

| | |
|---|---|
| දුඹුරු සීනි | ටින් මාලු |
| උකු කිරි | නැවුම් පලතුරු කෝඩියල් |
| පලතුරු රස පාන වර්ග | පිළිගැන්වීමට සූදානම් කරන පලතුරු බීම |

02) විදුලි උපකරණ

| | |
|---|---|
| ගෘහස්ථ උදුන් තැටි | විදුලි බල්බ |
| ගෘහස්ථ විදුලි පහන් හොල්ඩර් | ගෘහස්ථ විදුලි ස්විච් |

03) සිමෙන්ති හා සිමෙන්ති නිශ්පාදිත

| | |
|---|---|
| සාමාන්‍ය පොට්ලන්ඩ් සිමෙන්ති | හුණු ගල් මිස්ත්‍ර සිමින්ති |
| මේසන් සිමින්ති | හයිඩොලික් සිමෙන්ති |
| සිමින්ති බ්ගගල් | |

04) වානේ නිෂ්පාදන

කොන්ක්‍රීට් ශක්තිමත් කිරීම සඳහා වූ මෘදු වානේ දඬු

කොන්ක්‍රීට් ශක්තිමත් කිරීම සඳහා වූ දාර සහිත වානේ දඬු

කම්බි කණු සඳහා මෘදු වානේ කම්බි

යූ වානේ දඬු

එල් වානේ දඬු

ටි වානේ දඬු

05) වෙනත් නිෂ්පාදන

| | |
|---|---|
| PVC පයිප්ප | PVC පයිප්ප සන්ධි සහ උපාංග |
| දත් බුරුසු | දන්තාලේප |
| මැටි සෙවිලි උළු | මැටි මුදුන් උළු |
| මදුරු දගර | මදුරු මැටි |

'එල්එස් අනිවාර්ය භාණ්ඩ ලයිට් විද්‍යාවේ අවශ්‍ය නිරන්තරයෙන් වෙනස් කිරීමට

ආහාර සුරක්ෂිතතා පළමු බ් කළමනාකරණය සඳහා වූ අන්තර්ජාතික ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේ දී නිපදවන ආහාර වලින් සිදුවිය හැකි පසවූ පසුව පාලනය කිරීමේ කටයුතු වල නිවැරදි තාවය හා ඒවායේ සෞඛ්‍යාරක්ෂිත බව සුරක්ෂිත බවක් පෙන්වා දී ඇති බව සහතික කිරීමයි  වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිත සහ කළමනා කළමනාකරණ පද්ධති ජාතික ආයතනයක් විසින් මෙහෙයුම් ක්‍රියාවලියේ දී සේවක ආරක්ෂාවට තර්ජනයක් විය හැකි අවස්ථා හඳුනාගෙන ඒවා වලලක්වා ගනිමි කාර්යයන් බලධාරියා කළමනණාකරන බවට ආරක්ෂාව සඳහා ඔහු දැවී ගිය බව සහතික කරමින් මිය නිකුත් කරයි යහපත් නිෂ්පාදන පරිචයන් සඳහා වූ සමවූ සමස්ත නිෂ්පාදන ක්‍රියා ක්‍රියාවලිය නමක් උදාවේ සිට නිමි භාණ්ඩ දක්වා සමස්ත ක්‍රියාවලිය යහපත් සද්දෙ සිදුකරන බවට සහතිකය වර්තමාන ඖෂධ සඳහා මෙම සංවාදය  මෙම සහතිකයඅනිවාර්‍ය වේ පරිසර කළමනා

පරිසර කළමනාකරලමනාකරණ පද්ධති සහතිකයයි සියලුම භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලිය තුළින් සිදුවිය හැකි බවට  තුළින් හරි පරිසරේට සිදුවිය හැකි උපද්‍රව නිසි පරිදි කළමනාකරණය කරන බව මෙමගින් සහතික කිරි කාර්මික උපද්‍රව  අවම කිරීමමෙහි අර අරමුණයි තත්ත්වීත්ව කළමනාකරණත්ව කළමනාකරණ පද්ධතිය පිළිබඳ ආයතනයක් විසින් සකස් කර ඇති අන්තර්ජාතික ප්‍රමිතිය භාණ්ඩ හා සේවා නිර්මාණය සංවර්ධනය නිෂ්පාදනය ස්ථාපිත කිරීම හා ඒවා සම්බන්ධ සංයුක්ත තත්ත්වය ස්ථාපිත පද්ධතියයි ශ්‍රී ලංකාවේ ව්‍යාපාරිකයන්ට ලිපිය පහත ආයතන මගින් පහත් ආයතන මගින් ලබාගත් හැක ශ්‍රී ලංකා ප්‍රමිතිය ආයතනය අයියේ ාද අනුමත කිරීමට අවසර ලත් ජාත්‍යන්තර ආයතනවල මෙරට නියෝජිතයන් මාත් බ්‍රිතාන්‍යයේ ආයතනය නෙදර්ලන්තය නෙදර්ලන්තයේ ලන්දේසි සමිති කරන මණ්ඩලය ඇමරිකා එක්සත් ජන ජනපදය මබසඑා නසබටාදජ්දජස්එසදබ ආයතනය පරිසර කළමනාකරලමනාකරණ පද්ධති සහතිකයයි සියලුම භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලිය තුළින් සිදුවිය හැකි බවට  තුළින් හරි පරිසරේට සිදුවිය හැකි උපද්‍රව නිසි පරිදි කළමනාකරණය කරන බව මෙමගින් සහතික කිරි කාර්මික උපද්‍රව  අවම කිරීමමෙහි අර අරමුණයි තත්ත්වීත්ව කළමනාකරණත්ව කළමනාකරණ පද්ධතිය පිළිබඳ ආයතනයක් විසින් සකස් කර ඇති අන්තර්ජාතික ප්‍රමිතිය භාණ්ඩ හා සේවා

නිර්මාණය සංවර්ධනය නිෂ්පාදනය ස්ථාපිත කිරීම හා ඒවා සම්බන්ධ සංයුක්ත තත්ත්වය ස්ථාපිත පද්ධතියයි ශ්‍රී ලංකාවේ ව්‍යාපාරිකයන්ට ලිපිය පහත ආයතන මගින් පහත් ආයතන මගින් ලබාගත් හැක ශ්‍රී ලංකා ප්‍රමිතිය ආයතනය අයියේ ාද අනුමත කිරීමට අවසර ලත් ජාත්‍යන්තර ආයතනවල මෙරට නියෝජිතයන් මාත් බ්‍රිතාන්‍යයේ ආයතනය නෙදර්ලන්තය නෙදර්ලන්තයේ ලන්දේසි සමිති කරන මණ්ඩලය ඇමරිකා එක්සත් ජන ජනපදය මබසඑා නසබටාදජ්දජස්එසදබ ආයතනය

සමාජ වගකීම් පෙළ පිළිබඳ මාර්ග මාර්ගෝපදේශ යයි යතනතනයක් සමාජ වගකීම් ඉටු කරමින් ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සිදු කළ යුතු බව මග පෙන්වීමක් මෙම ලිපියෙන් ලබාදේ බලශක්ති කළමනාකරණ දිසාධිකරණය ජුනි 15 වන දින අන්තර්ජාතික හෝ සඳුදා විෂය හඳුන්වා දෙන ලදී යම් ආයතනයක බලශක්ති භාවිතය ඉහි කළමනාකරණ පද්ධතිය හා ඒකාබද්ධ කෙරෙන ක්‍රියා රාමුව හඳුන්වා දී ඇත බලශක්ති පාරිභෝජනය කාර්යක්ශම උප කරණ සඳහා ලබාදෙන ලේබලය විදුලි උපකරණ වල ක්‍රියාකාරිත්වය සඳහා විදුලි බලය උපයෝගී කරගනු ලබනවා කාර්යක්ෂමතාවය අනුව සලකුණ මගින් මෙම ප්‍රමිතිය ලබා දෙයි

සමාජ වගකීම පිළිබඳ සහතික කරන යයි සමාජ වගකීම් වැකස පිළිබඳ සහ ජාත්‍යන්තර ආයතනය අන්තර්ජාතික කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් මෙම ප්‍රමිතිය ක්‍රියාත්මක කරයි ආයතන වල සේවය කරන සේ සේවකයන් ගේ සමාජ වගකීම හීතියෙන් කඩුපුල් කළමනාකරණය කරන බවට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සහති ක වන බවට අදහස් වෙයි වදි පවදි පාලන අවස්ථා යන්නෙහි මෙහි අර්ථයයි ආහාර නිෂ්පාදන හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ආරම්භයේ සිට අවසානය දක්වා සිදුකළ බව සහතික වෙමින් මෙම ලිපිය නිකුත් කර මාළු ඇතුළු ආහාර හේතු පියා ාැවියසනය් වර්ග නිෂ්පාදනය කිරීමේදී කියවනය එමෙන්ම සහ සහතික කරන මෙම සහතිකකරණය අනිවා අනිවාර්යය වේ ආහාර ද්‍රව්‍ය ද්‍රව්‍යවල අඩංගු විය යුතු රසායනික ද්‍රව්‍ය ප්‍රමාණය සහතික අනිවාර්ය කළ හැකි අන්තර්ජාතික ප්‍රමිතියයි

සුපිරි වෙළඳසැල් කළමනාකණනාකරණ සහතික යන ප්‍රමිතියට අනුකූලව හඳුන්වාදී ඇති තමා තුළ එහි පාට පාට කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව සහතික කරමින් ලබා දෙන ප්‍රමිති ප්‍රමිතිප්‍රමිතිකරණයේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා ශ්‍රී ලංකා සී මණ්ඩලය එක්ව උසස් ප්‍රමිති යුත්තේ පාරිභෝගිකයාට ලබා දීමෙන් ඒවා නිෂ්පාදනයය කිරීමත් සාධකයක් දිරිගැන්වීමටත් ලබා දෙන සහතිකදෙන සහතිකකරණය කාබනික කෘෂිකාර්මික නිෂ්පාදන සහතික කරණය කෘෂිකාර්මික හා සත්ව නිෂ්පාදන කාබනික ක්‍රමවේදයන්ට අනුකූල වන බව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් නිකුත් කරමින් කියයි සහතිකය කුඩා පරිමාණ කර්මාන්තකරුවන් සඳහා විදාතා මධ්‍යස්ථාන හා එක්ව ශ්‍රී ලංකා විද්‍යාලය මඟින් පිරිනමනු ලබන විදිහයි නිර්මාංශ ආහාර පද්ධතිය නිර්මාණ නිෂ්පාදන ක්‍රියාවලිජ් සඳහා �ඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ලබා දෙන සහතික කර සහතික කරණයසහතික කරන බසිය නිෂ්පාදන සහතික කරන පද්ධති සහතිකකරණය කරන බලශක්ති කාර්යක්ෂමතා ලේබලය තේ නිපැයුම් සහතිකය එය සහතික වැනි හදන සඳහා වන භාණ්ඩ ඇසුරුම් ප්‍රදර්ශනයය කිරීම තුළින් නිෂ්පාදිතයක වුණත් ඒ පිළිබඳ තෙවන පාර්ශ්වයක් සහතික ලබාදීමේ තුමිය නිෂ්පාදන සහතික කරණය සියලුම අංකශවල තාත්තා සහතික කිරීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීමේ දදී ් රසක්බන් පන්තිය

Good Luck All The